# දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම - අම්පාර
## රැස්වීම් වාර්තාව

**01.** දිනය :- 2024.04.04 වේලාව :- පෙ.ව. 10.00

**02.** ස්ථානය :- ඒ.අයි. වික්‍රම ශ්‍රවණාගාරය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර.

**03.** ප්‍රධානත්වය :- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී. වීරසිංහ මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඒ.එල්.එම්. අතාවුල්ලා මැතිතුමා

**04.** මෙහෙයවීම :- දිස්ත්‍රික් ලේකම් චින්තක අබේවික්‍රම මහතා

**05.** සහභාගීත්වය :- මෙම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා සහභාගී වූ දේශපාලන අධිකාරිය, නැගෙනහිර පළාත් සභාවේ හා දිස්ත්‍රික්කයේ සියලුම ආයතන නියෝජනය කරමින් පැමිණි නිළධාරීන් සහ ආරක්ෂක අංශවල ප්‍රධානීන්ගේ පැමිණීමේ ලේඛනය අමුණා ඇත. (ඇමුණුම 1)

**06. පිළිගැනීම හා අරමුණ පැහැදිලි කිරීම** :- දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිතුමන් විසින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව අමතමින්, පැමිණ සිටි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී. වීරසිංහ මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මැතිතුමා, සියළුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් ඇතුළු පළාත් සභාව නියෝජනය කරමින් පැමිණි හා දිස්ත්‍රික්කයේ සියලුම ආයතන නියෝජනය කරමින් පැමිණි නිළධාරීන් ඉතා සුහදව පිළිගන්නා ලදී. අනතුරුව ගරු සමසභාපතිවරුන් වෙත දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ කටයුතු ඉදිරියට පවත්වාගෙන යාම සඳහා භාර දෙන ලදී.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී. වීරසිංහ මැතිතුමා විසින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මැතිතුමා, සියළුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, දිස්ත්‍රික් ලේකම් ඇතුළු සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්, සියළුම ආයතන ප්‍රධානීන්, සියළුම ආරක්ෂක අංශවල ප්‍රධානීන් සහ අම්පාර දිස්ත්‍රික්කයේ සියළු රාජ්‍ය නිළධාරීන් පිළිගන්නා ලදී. සාමාන්‍යයෙන් මෙම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පෙ.ව.9.30 පැවැත්වූ නමුත් නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා සහ පළාත් සභා නිළධාරී විසින් ඔවුන් ත්‍රිකුණාමලයේ සිට පැමිණෙන බැවින් රැස්වීම පෙ.ව.10.00ට පවත්වන ලෙස කල ඉල්ලීම අනුව අද දින පෙ.ව.10.00 මෙම රැස්වීම අද දින පැවැත්වීමට තීරණය කල බව සඳහන් කරන ලදී.
ඉන්පසු න්‍යාය පත්‍රය අනුව මුලින්ම ජාතික මට්ටමින් ක්‍රියාත්මක අලුත් ගමක් අලුත් රටක් සංවර්ධන වැඩසටහන හා ආහාර සුරක්ෂිතතා වැඩසටහන පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය, 2024 යල කන්නයේ වගා කටයුතු පිළිබඳ දැනුවත් කිරීම හා අඩු ආදායම්ලාභී පවුල් සඳහා රජය මගින් නොමිලේ සහල් බෙදාදීමේ වැඩසටහන පිළිබඳ සභාව දැනුවත් කිරීමට දිස්ත්‍රික් ලේකම්තුමන් වෙත ආරාධනා කරන ලදී.

**07. ජාතික මට්ටමින් ක්‍රියාත්මක අලුත් ගමක් අලුත් රටක් සංවර්ධන වැඩසටහන හා ආහාර සුරක්ෂිතතා වැඩසටහන පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය, 2024 යල කන්නයේ වගා කටයුතු පිළිබඳ දැනුවත් කිරීම හා අඩු ආදායම්ලාභී පවුල් සඳහා රජය මගින් නොමිලේ සහල් බෙදාදීමේ වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීම.**

මෙවර යල කන්නයේ වී වගා කිරීමට අපේක්ෂිත භූමි ප්‍රමාණය හෙක්ටයාර 68956ක් බව සඳහන් කරන ලදී. වී වගාවට අවශ්‍ය පොහොර මිළදී ගැනීම සඳහා හෙක්ටයාර එකකට රුපියල් 15000.00 බැගින් උපරිමය හෙක්ටයාර දෙකක් සඳහා රුපියල් 30000.00 ලබා දීමට කටයුතු කර ඇති බවත්, එම මුදල් ගොවීන්ගේ බැංකු ගිණුම් වෙත බැර කිරීමට කටයුතු කර ඇති බවත් සඳහන් කරන ලදී. මෙවර ගොවීන්ට ගොවිජන සේවා මධ්‍යස්ථානවලින් හෝ විවෘත වෙළඳපොලෙන් පොහොර මිළදී ගැනීමේ හැකියාව පවතින බවත්, ගොවිජන සේවා මධ්‍යස්ථානවලින් යූරියා මිටියක් රු.9000.00කටත් Mop රු.9000.00කටත් TSP රු.11500.00කටත් මිළදී ගැනීමේ හැකියාව පවතින බව සඳහන් කරන ලදී.

2023/2024 මහ කන්නයේ ගංවතුර නිසා හානියට පත්වූ වී සහ බඩඉරිගු ගොවීන්ට වන්දි අප්‍රේල් මස 15ට පෙර ගෙවීමට කෘෂිරක්ෂණ මණ්ඩල නිළධාරීන් වැඩ කටයුතු කරමින් සිටින බව පැවසීය. වී ගොවීන් 18887 දෙනකුට අක්කර 37460 වෙනුවෙන් සහ බඩඉරිගු ගොවීන් 575 දෙනකුට අක්කර 761 වෙනුවෙන් වන්දි හිමිවීමට නියමිත බවද පැවසීය.

අඩු ආදායම්ලාභී පවුල් සඳහා රජය මගින් නොමිලේ සහල් කිලෝ 10ක් ලබාදීමේ අතිගරු ජනාධිපතිතුමාගේ වැඩසටහන අනුව තම්බපු නාඩු සහල් කිලෝ 10ක් රු.1900.00කටත් රතු සහල් කිලෝ 10ක් රු.1860.00කටත් විවෘත වෙළඳ පොලෙන් මිලදී ගෙන අඩු ආදායම්ලාභීන් හට බෙදාදෙන බව පැවසීය. මෙම සහල් අස්වැසුම හිමි සියලුදෙනාටද, මහජන ආධාර ලබන අයටද, වකුගඩු දීමනා ලාභීන්ටද, ආබාධිත දීමනා ලාභීන්ටද, වැඩිහිටි දීමනා ලාභීන්ටද, ප්‍රාදේශීය ලේකම් විසින් අඩු ආදායම්ලාභී ලෙස හඳුනාගෙන ඇති අයටද හිමිවන බව පැවසීය. ඒ සඳහා අවශ්‍ය ලේඛන අද සවස 3.00වනවිට ලබා දෙන ලෙස සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇති බව සඳහන් කරන ලදී. මෙහිදී අප දිස්ත්‍රික්කය තුළ සහල් බෙදාහැරීමට අමතරව නුවරඑළිය දිස්ත්‍රික්කය සඳහාද අපගෙන් සහල් ඉල්ලා ඇති බව ප්‍රකාශ කරන ලදී. එනිසා මෙම වැඩසටහන පිළිබඳ ඉදිරි කටයුතු කිරීමට අප දිස්ත්‍රික්කයේ සියළුම වී මෝල් හිමියන් සමග අද සවස 3.00ට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රැස්වීමක් සංවිධානය කර ඇති බවත් සඳහන් කරන ලදී.

**08. දිස්ත්‍රික් මට්ටමින් දේශීය හා විදේශීය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය**

**8.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති**

2024 වර්ෂය සඳහා විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 402 ප්‍රතිපාදන ලැබී ඇති බවත්, අනුමැතිය සඳහා ව්‍යාපෘති 1032ක් යොමුකර එයින් මේවන විට ව්‍යාපෘති 985ක් සඳහා අනුමැතිය ලැබී ඇති බවත් සඳහන් කරන ලදී. තවත් ව්‍යාපෘති 47ක් සඳහා අනුමැතිය ලැබිය යුතු බවත් ඒ සඳහා මිලියන 46.9ක ප්‍රතිපාදන ලැබිය යුතු බව සඳහන් කරන ලදී. මෙහිදී ඉදිකිරීම් ව්‍යාපෘති 373ක් සඳහා ප්‍රතිපාදන මිලියන 213.88 සහ මිලදී ගැනීම් ව්‍යාපෘති 612ක් සඳහා රුපියල් මිලියන 141.22ක ප්‍රතිපාදන ලැබී ඇති බවත් සඳහන් කරන ලදී.

කඳුකර දශකය ව්‍යාපෘතිය යටතේ පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පමණක් ග්‍රාම නිළධාරී වසම් 5ක් සඳහා ව්‍යාපෘති 13ක් සඳහා රුපියල් මිලියන 5ක ප්‍රතිපාදන ලැබී ඇති බවත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතින බවත් සඳහන් කරන ලදී.

එළු පාලන ව්‍යාපෘති සඳහා මිලියන 5ක ප්‍රතිපාදන ලැබී ඇති බවත් ඒ සඳහා ප්‍රතිලාභීන් 56 දෙනෙක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 19ක් සහ උප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයත් තෝරාගෙන ක්‍රියාත්මක වන බව පැවසීය.

නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ සාමාජිකයන් 2ක් හෝ ඊට අඩුවෙන් සිටින පවුල් සඳහා රුපියල් මිලියන 0.6 නිවාස 47ක් සහ සාමාජිකයන් 2ට වැඩි පවුල් සඳහා රුපියල් මිලියන 1 නිවාස 96ක් සඳහා අනුමැතිය ලැබී ඇති බවත් ඒ සඳහා රුපියල් මිලියන 124.07ක ප්‍රතිපාදන ලැබී ඇති බවත් සඳහන් කරන ලදී.

**8.2 කෘෂි නවීකරණ ව්‍යාපෘතිය (ASMP)**

මෙම වැඩසටහනට 2024 දෙසැම්බර් වන විට අවසන් කලයුතු බව ව්‍යාපෘති අධ්‍යක්ෂ සඳහන් කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ කටුඅනෝදා, වියලි මිරිස්,රටකජු, දේශීය දෙමුහුන් බඩඉරිගු වගා කරන බව සඳහන් කරන ලදී. මේවන විට සැකසුම් ඒකකවල යම් යම් ගැටළු පවතින බවත් සඳහන් කරන ලදී. මෙහිදී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී. වීරසිංහ මැතිතුමා විසින් ගොවීන්ට වගා ආවරණ කටයුතු සඳහා ලබාදී ඇති ඉටිකොළ තත්ත්වයෙන් පහල ඒවා බවත්, ඒවා එලන අවස්ථාවේදීම ඉරීයන බවත් පවසා සිටින ලදී. තවද ගොවීන් විසින් භූමිතෙල් වතුර මෝටර ඉල්ලා සිටියත් මෙම ව්‍යාපෘතිය මගින් විදුලි වතුර මෝටර ලබා දී තිබූ බවත් එම ප්‍රදේශ සඳහා විදුලි සැපයුම් පවා නොමැති බවත් පෙන්වා දෙන ලදී. තවද මින් ඉදිරියට එසේ නොවන ආකාරයෙන් කටයුතු කරන ලෙසද උපදෙස් ලබා දුනි.

ඉන්පසු පදියතලාව කටුඅනෝදා සැකසුම් ඒකකය සෑදීමේ ඉඩමේ පවතින ගැටළුව සම්බන්ධයෙන් විමසන ලදී. එහිදී මෙම ඉඩම සම්බන්ධයෙන් පළාත් කෘෂිකර්ම ලේකම්ගෙන් ඉල්ලීම් ලිපිය මේවනතුරු ලැබී

නොමැති බව නේවාසික ව්‍යාපෘති කළමණාකාර විසින් ප්‍රකාශ කරන ලදී. මෙම ගැටළුව ඉදිරි සතියක කාලයක් තුල විසඳා ගන්නා ලෙස නේවාසික ව්‍යාපෘති කළමණාකාරට උපදෙස් ලබාදුන් අතර පසු අනුමැතියට යටත්ව මෙම ව්‍යාපෘතියේ ඉදිරි වැඩකටයුතු කරගෙන යාමට ඉඩ ලබාදීමට නේවාසික ව්‍යාපෘති කළමණාකාර එකඟ විය.

පසුව උහන කටුඅනෝදා සැකසුම් ඒකක භූමියේ ඇති සමූපකාර දෙපාර්තමේන්තුවට අයත් අබලන් ගොඩනැගිල්ල ඉවත් කිරීමේ ගැටළුව සම්බන්ධයෙන් විමසන ලදී. එවිට එය සමූපකාර දෙපාර්තමේන්තුවට අයත් නොවන බව එම දෙපාර්තමේන්තුවේ පැමිණ සිටි නිළධාරියා පැවසීය. එනිසා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් එය ඉවත් කිරීමට තීරණය කල අතර උහන ප්‍රාදේශීය ලේකම්ට එය ඉවත් කරන ලෙසට උපදෙස් ලබාදුනි.

කෝමාරිය වියලි මිරිස්, රටකජු සැකසුම් ඒකකයේ ඉඩමේ මැනුම් කටයුතු සිදුනොවීම සම්බන්ධයෙන් ද මෙහිදී විමසන ලදී. එය මැනුම් කටයුතු සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට භාරදී ඇති බවට පොතුවිල් ප්‍රාදේශීය ලේකම්වරයා පැවසීය.මෙහිදී මේ සම්බන්ධයෙන් සම්බන්ධීකරණය කර ඉක්මනින් කටයුතු ඉටුකර දෙන ලෙස පොතුවිල් ප්‍රාදේශීය ලේකම්ට දැන්වීය.

දමන වියලි මිරිස් සැකසුම් ඒකකයට පවතින ගොඩනැගිල්ල පිළිසකර කිරීමට සිදුව තිබීම සම්බන්ධයෙන්ද විමසන ලදී. එහිදී රජයේ තාක්ෂණ නිළධාරිවරයකුගේ සහය අවශ්‍ය බව පැවසීය. එවිට දමන ප්‍රාදේශීය ලේකම්ට මේ පිළිබඳ සොයා බලා කටයුතු කිරීමට උපදෙස් ලබාදුනි.

රජගලතැන්න බඩඉරිගු ව්‍යාපෘතියේ ඉඩම සම්බන්ධ ගැටළුව සම්බන්ධයෙන් විමසන ලදී. එවිට එම ඉඩම සාරම්පරික හේන් ඉඩමක් බවත් වනජීවී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවලට අයත් ඉඩම් බැහැර කිරීමේ අභ්‍යාසය යටතේ නිදහස් කිරීමට යෝජිත ඉඩමක් බවත් සඳහන් කරන ලදී. මෙය දිස්ත්‍රික් අවශේෂ කැලෑ යටතේ හඳුනාගත් ඉඩමක් බවත් අන්තර් අමාත්‍යාංශ සමුළුවේදී මෙය ප්‍රතික්ෂේප නොවූ බවද දිස්ත්‍රික් ලේකම් පැවසීය.

ඉන්පසු දමන මිරිස් ව්‍යාපෘතිය සඳහා ලබාදී තිබූ ට්‍රැක්ටරය සම්බන්ධයෙන් විමසන ලදී. වෙනත් දිනකදී මේ සම්බන්ධයෙන් රැස්වීමක් කැඳවා තීරණය කිරීමට එකඟ විය. මෙම මිරිස් ව්‍යාපෘතිය සාර්ථකව සිදුවන බැවින් ගොවීන්ට අවශ්‍ය පහසුකම් සපයා දෙන ලෙසද දැන්වීය.

**8.3 වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන ( CresMPA ) අදාළ ව්‍යාපෘති ප්‍රගතිය**

මෙම වැඩසටහනේ ප්‍රගතිය ඉදිරිපත් කිරීමට වාරිමාර්ග අධ්‍යක්ෂ නොමැති හෙයින් පසුදිනක සාකච්ඡා කිරීමට තීරණය විය.

**8.4 වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ඒකාබද්ධ ජලධාරා හා ජලසම්පත් කළමණාකරණ ව්‍යාපෘති (IWWRMP) ප්‍රගතිය**

මේ යටතේ රඹකැන්ඔය කලාපයේ රුපියල් මිලියන 112ක ව්‍යාපෘති 19ක් පදියතලාව සහ රඹකැන්ඔය කලාපයේ ක්‍රියාත්මක කිරීමට නියමිත බවත් දැනට පදියතලාව ව්‍යාපෘති 4ක වැඩ ආරම්භ කර අවසන් අදියරේ පවතින බවත් තවත් ව්‍යාපෘති 3ක් සඳහා අනුමැතිය ලැබී ඇති බවත් තවත් ව්‍යාපෘති 13ක් සඳහා අනුමැතිය බලාපොරත්තුවෙන් සිටින බවත් පවසන ලදී.

**09. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අනුව භාෂා පුහුණු අවශ්‍යතාවය මත සිංහල,දෙමළ පැය 200,150,100 යන ප්‍රවීණතා මට්ටම් සඳහා කුඩුරුවත් පුහුණුව අවශ්‍ය නිලධාරීන්ගේ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය පිළිබඳ දැනුවත් කිරීම**

රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්ගේ ඉල්ලීම් ලිපිය අනුව මේ කාරණය සම්බන්ධයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව මගින් සියළුම ආයතන ප්‍රධානීන් දැනුවත් කර ජාතික ඒකාබද්ධ ප්‍රවර්ධන සහකාර නිළධාරීන් මාර්ගයෙන් භාෂා පුහුණුව අවශ්‍ය නිළධාරීන්ගේ තොරතුරු රැස්කර ඔවුන්ට අවශ්‍ය භාෂා පුහුණුව ලබාදීමට කටයුතු කිරීමට සහය දක්වන ලෙස ඉල්ලා ඇති බව දිසාපති විසින් සඳහන් කරන ලදී.

## 10. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු යෝජනා

| අනු අංක | යෝජනාව | තීරණය |
|---|---|---|
| 01 | වන සංරක්ෂණ හා වනජීවී දෙපාර්තමේන්තුවට අයත් නොවන පොතුවිල්, ලාහුගල, තිරික්කෝවිල්, ආලයඩිවෙම්බු, කාර්තිව්, නාවිදන්වේලි, කන්නකි ග්‍රාමම් යන ප්‍රදේශයන්හි රජයේ ඉඩම් වල කඩොලාන නඩත්තු කිරීම සහ නැවත වගා කිරීමට අදාල කටයුතු පළාත් පාලන ආයතන විසින් සිදු කිරීම පිළිබද යෝජනාව සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීම. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් අනුමත කරන ලදී. |
| 02 | 2024 වර්ෂයේදී අම්පාර ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති යෝජනාවන් සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීම. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් අනුමත කරන ලදී. |
| 03 | 1500 Km මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති 04ක් සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීම. | මේවා අදාල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ඇතිව ඊලග දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කරන ලෙස දැන්වීය. |
| 04 | පදියතලාව නගරය සඳහා විධිමත් නාගරික සැලැස්මක්, නාගරික සංවර්ධන අධිකාරිය මගින් සකස්කර ගැනීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීම. | මේ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදුන් අතර මේ පිළිබඳ නාගරික සංවර්ධන දෙපාර්තමේන්තුවට සහ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කරන ලෙසත් දැන්විය. |
| 05 | ආපදා අවම කිරීමේ ව්‍යාපෘති යෝජනා සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීම. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදුනි. |
| 06 | යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එස්. ගජේන්ද්‍රන් මැතිතුමාගේ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ඉදිරිපත්කල ව්‍යාපෘති ලැයිස්තුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදුනි. |

## 11. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර විසඳුම් නොලැබුණු විශේෂ ගැටළු

| අනු අංක | යෝජනාව | තීරණය |
|---|---|---|
| 01. | 01. රජයේ ඉඩම් වල අනවසරෙන් පදිංචිව සිටින සහ ඒවා සඳහා ව්‍යාජ ලිපි ලේඛන සකස් කර ඇති අය හඳුනාගෙන රජයේ ඉඩම් ප්‍රතිසාධන පනතට අනුව කඩිනමින් එම පදිංචිකරුවන් එම ඉඩම් වලින් ඉවත් කිරීමට කටයුතු කිරීම.<br>02. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් තම කොට්ඨාස වල නීති විරෝධී ලෙස අනවසරයෙන් අත්පත් කරගත් රජයේ ඉඩම් පිළිබඳ සියලුම විස්තර දින 15ක් ඇතුළත නැගෙනහිර පළාත් ආණ්ඩුකාරතුමා වෙත දැනුම් දීම. | මෙහි වගකීම දිසාපතිතුමා විසින් භාර ගන්නා ලෙසත් සති 2 තුල සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් තම කොට්ඨාස වල නීති විරෝධී ලෙස අනවසරෙන් අත්පත් කරගත් රජයේ ඉඩම් පිළිබද සියලුම විස්තර ලබා දෙන ලෙසත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා විසින් පවසන ලදී. |

| | | |
|---|---|---|
| 02. | ආරක්ෂක හේතූන් මත යුධ සමයේ වසා දැමූ හිමිදුරාව ගුවන් හමුදා කඳවුර හරහා අම්පාරට දිවෙන මාර්ගයේ ආරක්ෂක හේතූන් මත නැවත සාමාන්‍ය ජනතාවට විවෘත කර නොහැකි බැවින්, එයට විකල්ප මාර්ගයක් ලෙස 12 ඇළ අක්කර 100 මාර්ගයේ 45 නිවස ඉදිරිපිට සුසාන භූමිය හරහා අම්පාර කරංගාව වැව් බැම්ම දක්වා මාර්ගය සුදුසු බව යෝජනා කිරීම. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් අනුමත කරන ලදී. වනජීවී කලාපයට අයත් කොටසක් පවතින බැවින් වනජීවී දෙපාර්තමේන්තුවෙන් අවසර ලබා ගන්නා ලෙස දැන්වීය. |

**12.** සාකච්ඡා කළ වෙනත් යෝජනා

**12.1 දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කලෙයි අරසන් මැතිතුමා විසින් කල්මුණ උතුර කොට්ඨාසයට අදාලව ගත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විමසන ලදී.**

මේ සම්බන්ධයෙන් දිසාපතිතුමා විසින් අදහස් දක්වමින් මීට පෙරත් හිටපු දිසාපතිවරුන් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිහිපයක් පවත්වා ඇති බවත් අපට ලැබෙන සියළු ඉල්ලීම් අමාත්‍යාංශය වෙත යොමුකර ඇති බවත් අනුමත නිළධාරී ලැයිස්තුවේ ඇත්තේ සහකාර ප්‍රාදේශීය තනතුරක් බවත් මෙය තවම උප කාර්යාලයක් ලෙස ඇති බවත් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධයෙන් නඩු කටයුතුද පවතින බව වැඩිදුරටත් දන්වා සිටින ලදී.

**12.2 දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එන්.එම්.එම්. මුෂාරෆ් මැතිතුමා විසින් පළාත් ගුරුමාරු සම්බන්ධයෙන් තොරතුරු විමසන ලදී.**

මේ දිනවල රාමසාන් උත්සව සමය නිසා ස්ථාන මාරුවීම් ලද අදාල පාසල්වල සේවයට වාර්තා නොකල ගුරුවරුන් සඳහා දින 10කින් පසුව විනය ක්‍රියා මාර්ග ගන්නා බව පළාත් අධ්‍යාපන ලේකම් පවසන ලදී. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා අද දින සවස මෙම රැස්වීමෙන් අනතුරුව පළාත් අධ්‍යාපන ලේකම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධක්ෂවරු යන සියළුම දෙනා එක්ව සාකච්ඡා කර ගුරුවරුන් අඩු පාසල් සඳහා ගුරුවරු වැඩි පාසල්වලින් ස්ථාන මාරුකර සකස් කරන ලෙසද දැන්වීය.

නුවරගලතැන්න විද්‍යාලයේ ගුරුවරු දෙදෙනෙක් විනය හේතූන්මත යැයි පවසමින් ස්ථානමාරු කර මේවන විට මාස 3කට අධික කාලයක් බවත් අද දින මහඔය කලාපයේ විදුහල්පතිවරයෙක් සිසුවෙකුට පහරදීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂනයක් සිදු කිරීමට විරෝධය ලෙස එම පාසලේ සියළුම ගුරුවරුන් නිවාඩු දමා ඇති බව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී. වීරසිංහ මැතිතුමා විසින් පවසන ලදී. මෙම කරුණු සම්බන්ධයෙන් සොයාබලා කටයුතු කරන ලෙසත් මහඔය කලාපයේ ගැටළුව සම්බන්ධයෙන් වාර්තාවක් සතියක් තුළ ලබාදෙන ලෙසත්, පළාත් අධ්‍යාපන ලේකම්ට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා විසින් උපදෙස් ලබාදෙන ලදී.

**12.3 දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වෛද්‍ය තිලක් රාජපක්ෂ මැතිතුමා විසින් අම්පාර දිස්ත්‍රික්කයේ රෝහල්වල සෞඛ්‍ය කාර්ය සහායක නිළධාරීන් තමන්ගේ ගම් ප්‍රදේශ වලට ස්ථාන මාරුවීම් නොමැතිව අවු. 7,8 එකම ස්ථානයේ සේවය කරන බවත් බහුකාර්ය රැකියා ලබාදීමේදී එම පුරප්පාඩු පුරවා ඇති බැවින් ඔවුන්ට ස්ථානමාරුවීම් ලබා ගැනීමට නොහැකිව සිටීම පිළිබඳව ප්‍රකාශ කරන ලදී.**

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා විසින් පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂට පවසා සිටියේ මෙම ගැටළුව පිළිබඳ වැඩිදුර ක්‍රියා කිරීමට පවතින ඌනතා සහ අතිරික්ත සෞඛ්‍ය කාර්ය සහයක පිළිබඳ තොරතුරු එතුමා වෙත ලබා දෙන ලෙස දැන්වීය.

**12.4 දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී. වීරසිංහ මැතිතුමා විසින් අද දින උදෑසන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු සෙන්දිල් තොන්ඩමාන් මැතිතුමා සහ ප්‍රාදේශීය ලේකම්වරුන් සමග පැවති රැස්වීමේදී ඔප්පු ලබාදීමේ වැඩ සටහනේදී දීර්ඝ කාලයක් වැව්ලි අමාත්‍යාංශය සහ ගල්ඔය වැව්ලි සමාගම සමග සාකච්ඡාකොට ඔප්පු ලබා දීමට තීරණය වුවද, එය අවසාන මොහොතේ නතර වී ඇති බව ප්‍රකාශ කරන ලදී. එබැවින් ගල්මඩුව, කීනවත්ත, දිවියාගල, උක්සිරිපුර, එක්ගල්ඔය, මුවංගල, තිඹිරිගොල්ල, අම්බලන්ඔය, කරලැව ප්‍රදේශවල ඔප්පු ලබාදීමට කඩිනමින් පියවර ගන්නා ලෙස දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන බව වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශයට දන්වන ලෙස දැන්වීය.**

**12.5 දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එන්.එම්.එම්. මුෂාරෆ් මැතිතුමා විසින් පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැනුම් කටයුතු නොකර ඉඩම් විශාල ප්‍රමාණයක් පවතින බවත්, එහි ක්ෂේත්‍ර නිළධාරීන් අඩු බවත්,ගණකාධිකාරී ස්ථිර නොමැති බවත්, සහකාර සැලසුම් අධ්‍යක්ෂ ස්ථිර නොමැති බවත්, ප්‍රාදේශීය සභාවේ ලේකම් ස්ථිර නොමැති බවත් සදහන් කරන ලදී. ඒ සදහා විසඳුමන් ලබා දෙන මෙන් ඉල්ලා සිටින ලදී.**

මේ තනතුරු සදහා බදවා ගැනීම් සිදු නොවන නිසාත් විශාල වශයෙන් නිළධාරීන් රැකියා සදහා විදේශ ගතවන නිසාත් නිළධාරීන්ගේ හිඟයක් පවතින බවත් කඩිනමින් මෙම ගැටළුව විසදීමට කටයුතු කරන බවත්,නැගෙනහිර පළාත් ප්‍රධාන  ලේකම් පවසන ලදී.

**12.6 දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වෛද්‍ය තිලක් රාජපක්ෂ මැතිතුමා විසින් මුරුතගස්පිටිය අනවසර ඉදිකිරීම ඉවත් කිරීම සම්බන්ධයෙන් විමසන ලදී.**

මෙය අනවසර ඉදිකිරීමක් නම් පොලිසියේ සහය ඇතිව පලාත් පාලන ආයතන නිළධාරීන්, පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තු නිළධාරීන්,මහවැලි අධිකාරිය හා ප්‍රාදේශීය ලේකම් එක්ව ඉවත් කිරීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී තීරණය කරන ලදී.

**13.** ස්තුති කථාව :

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමසභාපති දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්.ඩී.වීරසිංහ මැතිතුමා විසින් පැමිණි සිටි සියලුදෙනාට ස්තුතිය පළකර රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම්
අම්පාර.

චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
අම්පාර දිස්ත්‍රික්කය

ඇමුණුම 01

## දිස්ත්‍රික් සම්බන්ධීකරන කමිටු රැස්වීම - අම්ප□ර දිස්ත්‍රික්කය

**2024.04.04**

| අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 1 | ගරු සෙන්තිල් තොන්ඩමන් | සම සභාපති න□/ප ආණ්ඩුකාරවර | |
| 2 | ගරු ඩබ්.ඩී.වීරසිංහ | සම සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 3 | ගරු ඒ.එල්.එම්.අතාවුල්ලා | සම සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 4 | ගරු ඩබ්. දිසානායක | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 5 | ගරු වෛද්‍ය තිලක් රාජපක්ෂ | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 6 | ගරු ටී. කලෙයි අරසම් | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 7 | .ගරු එස්.එම්.එම්. මුෂාරෆ් | පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 8 | චින්තක අබේවික්‍රම | දිසාපති/ දිස්ත්‍රික් ලේකම් | |
| 9 | ආර්.එම්.පී.එස්. රත්නායක | ප්‍රධාන ලේකම් | න□ගනහිර පළාත් සභාව |
| 10 | එල්.පී. මදනායක | ආණ්ඩුකාර ලේකම් | න□ගනහිර පළාත |
| 11 | එන්. මතිවානන් | කොමසාරිස් | සමූපකාර දෙපාර්තමේන්තුව |
| 12 | එස්. කෝනේස්වරන් | පළාත් අධ්‍යක්ෂ | ගොඩනැ□ගිලි දෙපාර්තමේන්තුව |
| 13 | එම්.සී ජලාල්ඩීන් | සහකාර අධ්‍යක්ෂ කල්මුණෛ | සමූපකාර දෙපාර්තමේන්තුව |
| 14 | වෛද්‍ය ඩී.ජී.එම්. කොස්තා | RDHS | සෞඛ්‍ය |
| 15 | එස්. කුලේන්ද්‍රකුමාර | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | පළාත් අධ්‍යාපන |
| 16 | එස්.සුතාහරන් | පළාත් අධ්‍යක්ෂ ධීවර | පළාත් ධීවර |
| 17 | එන්.තනන්ජයන් | පළාත් අධ්‍යක්ෂ | ග්‍රාමීය සංවර්ධන |
| 18 | එම්.එම්.ජී.බී.එම්.රෂාඩ් | පළාත් සම්බන්ධීකාරක | NDDCB |
| 19 | කේ.පී.ආර්. මාධව | තාක්ෂණ නිළධාරී | ගොඩනැ□ගිලි දෙපාර්තමේන්තුව |
| 20 | එන්.එස්.එස්. නජීම් | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කල්මුණෛ |
| 21 | අයි.කේ.ඩී. මුතුබංඩා | ලේකම් | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 22 | එම්.එස්.ඒ. කලීස් | පළාත් අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 23 | එන්. මනිවානන් | ප්‍රධාන ලේකම් | න□ගනහිර පළාත් සභාව |
| 24 | එම්.එල්. ෆායිස් | අධ්‍යක්ෂ | P/Ie's off Aampra |
| 25 | වෛද්‍ය නධීර් | PD/DAPH/EP | DAPH |
| 26 | කේ.එල්.එම්.මුසම්මිල් | ALC/PLC | පළාත් ඉඩම් |
| 22 | එම්.අයි.රිස්වින් | TO | R.D.D. |
| 28 | එම්.ඒ.එම්.මොහොමඩ් | DDE | ZEO thirikkovil |
| 29 | ඩී.එම්. ප්‍රසන්න | CMFO | RDD |
| 30 | ටී.එම්.ඒම්. අන්සාර් | ප්‍රාදේශීය ලේකම් | අක්කරපත්තු |
| 31 | ඒ.එම්.ඒ.කුමාරි | ප්‍රාදේශීය ලේකම් | දමන |
| 32 | එම්.එස්.එම්. රෂාන් | ප්‍රාදේශීය ලේකම් | ඉරක්කාමම් |
| 33 | ජේ.ලියාකත් අලි | ප්‍රාදේශීය ලේකම් | කල්මුණෛ |
| 34 | එස්.ජෙගරාජන් | ප්‍රාදේශීය ලේකම් | කාරතිවු |
| 35 | ආර්.රාහුලනයාහි | ප්‍රාදේශීය ලේකම් | නාවිදන්වේලි |
| 36 | ඒ.එම්.අබ්දුල් ලතීෆ් | ප්‍රාදේශීය ලේකම් | නින්දවුර් |
| 37 | බී.වී.එස්. ගුණසේන | ප්‍රාදේශීය ලේකම් | පදියතලාව |
| 38 | එම්.අයි. පිර්නාස්මිස් | ප්‍රාදේශීය ලේකම් | පොතුවිල් |
| 39 | එස්.එල්.එම්.හනිෆා | ප්‍රාදේශීය ලේකම් | සමන්තුරෙයි |
| 40 | චින්තන උදාර නානායක්කාර | ප්‍රාදේශීය ලේකම් | උහන |
| 41 | එන්.නවනීතරාජා | ප්‍රාදේශීය ලේකම් | ලාහුගල |
| 42 | ටී.ජේ.අදිෂයිරාජ් | සහකාර ප්‍රාදේශීය ලේකම් | කල්මුණෛ උතුර |
| 43 | ඒ.එම්.ආසික් | ප්‍රාදේශීය ලේකම් | සායින්දමරුදු |
| 44 | එෆ්.එන්. මූසාහිර් | සහකාර ප්‍රාදේශීය ලේකම් | අඩ්ඩාලච්චේනයි |
| 45 | එම්.බී.අලියාර් | PD | RDA |
| 46 | යූ.ඒ. බාරි | EE | RDA |
| 47 | ටී.සිවසුබ්‍රමනියම් | CE | RDA/Akk. |
| 48 | එස්.පී.සීලන් | භාෂා පරිවර්ථක | DS office |

| | | | |
|---|---|---|---|
| 49 | එම්.ඒ.සී.එම්. රියාස් | DD | DMC Ampara |
| 50 | කේ.ඒ.නලීන් | ACCD | Co-op Development |
| 51 | එස්.එම්.එම්.එස්.උමාර් | ZDE | Education |
| 52 | කේ.එල්.ඒ. ආරියකීර්ති | DD | IDB |
| 53 | එච්.එම්.ඒ. බංඩාර | CM | Galoya Plantation |
| 54 | ඒ.එච්.එම්.මිස්ෆර් | DO in CGC | Hardy collage of Technical |
| 55 | ඩී.එම්.සී.ජේ. දිසානායක | කලාපභාර නිළධාරී | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව |
| 56 | ජී.ජී.එස්.අයි.නදීෂාන් | LUPD | Land use |
| 57 | කේ.එල්.ඩී.බී.පී. සෙනෙවිරත්න | ES | CEB |
| 58 | එච්.එම්.සී.හේරත් | AO | DGH Ampara |
| 59 | එම්.පී.එම්.වික්‍රමසිංහ | District Sports Officer | Sports |
| 60 | වෛද්‍ය ජේ.පොන්කාරන් | DCIM | Dept. of I. Medicine |
| 61 | ඒ.එම්.එම්.ෂාෆි | TO | RDA |
| 62 | ඩබ්.එම්.එච්.උදය කුමාර | DG | න/ප ප්‍රවාහන |
| 63 | පී.එල්.විමලදාස | AO | Wildlife |
| 64 | එස්. උදයරාජා | AO | CEA |
| 63 | එම්.ඒ. ලාල් කුමාර | SP officer | DPCCS-EP |
| 66 | එන්.පී.එස්.ඩබ්. ජයරත්න | Examiner | DMT |
| 67 | එම්.කුමාරත්න | M ampara | NWSDB |
| 68 | ජේ.ඒ.එස්. ජයලාල් | STO | CSIAP - EP |
| 69 | එස්.ඒ.එස්. කුමාරසිරි | RME | GSMB |
| 70 | අයි.එල්.එම්.ඒ. ජිෆ්රි | AE - Akp | NWS & DB |
| 71 | එස්. පරමේස්වරන් | | LRC |
| 72 | වෛද්‍ය ජලල්දීන් | MO / BH Akp | Health |
| 73 | ටී.සී.දේශප්‍රිය | R.P.M. | I.M.D. |
| 74 | එස්.එම්.අයි. මොරයාන | P.Manager | GOPPL |
| 75 | කේ.එල්.එම්.ස්මයිල් | CE/RDA Ampara | RDA |
| 76 | ඒ.එම්.ශෂී | Eg. RDA Ampara | RDA |
| 77 | එස්.රවිකුමාර් | ASS.Dirctor EP | NAQDA |
| 78 | ඒ.එම්.ඉම්රාන් | RPM Akkarapaththu | IDM |
| 79 | පී.ජී.එන්. ජයසිරි | RPM | MASL-C |
| 80 | ඒ.එල්.අයි.භානු | Land commissioner (IP) | LCG'S Dept. |
| 81 | වෛද්‍ය එස්.එම්.හුසේයින් | AF & CSIAP | AES |
| 82 | එච්.පී.එස්. තිලකරත්න | RPM - RO | MASL - RO |
| 83 | ඉසඩ්.ඒ.එම්. අස්මීර් | EE | RDA |
| 84 | වෛද්‍ය එම්.ඒ.නවුෆර් | Ayu.focal point | RDH Ayu. |
| 85 | එන් රමේෂ් | CIA Ampara | Kachcheriya |
| 86 | එච්.එම්.විජේරත්න | DRPM | MPSL |
| 87 | කේ. නිෂාන්ත | AD Planing | UDA |
| 88 | එච්.ටී.එම්.ඩබ්.ජී. දිස්නි | S/MOE - EP | eduction |
| 89 | ඒ.අබ්දුල් | OAT for C.E. | Dept. of Building |
| 90 | ජී.ඩී.අයි.රම්‍යලතන් | RPM | Irrigation |
| 91 | ඒ.එම්.රහමත්විලා | ZDE | Education |
| 92 | එල්.ජී. වාමිනී සෝමදාස | DCAD | Dept.of Agrarian Development |
| 93 | එස්. ආර්.හයන්ති | ZDE | ZEO Ampara |
| 94 | ඒ.එම්.රායික් | LD (HQ) | Kachcheriya |
| ~~95~~ | ~~කේ.එලන්කුමුතන්~~ | ~~AD~~ | ~~Social Service EP~~ |
| 96 | ඒ.කපිල නිශාන්ත | DO | AIB Ampara |
| 97 | එම්.පී.සී.පී.කුමරන් | P/O | CSP |
| 98 | කේ.ශිවකුමාර් | Assistant Manager | MEPA |
| 99 | එන්.ශ්‍රීරංජන් | Asst.Director | Fishries Department |
| 100 | වී.ටී. සම්බන්දන් | AE | CEB |

| | | | |
|---|---|---|---|
| 101 | ජී.ඩී.ඩී.ලඹවන් | EE | RDA |
| 102 | අයි.ඩී.ඩී.පී.කේ. පෙරේරා | OIC SCS | SCS Ampara |
| 103 | කමල් නෙත්මිණ | ACLG | ACLG |
| 104 | කසුන් නිමන්ත | DC-Asmp | ASMP |
| 105 | කසුන් සංදීප | ESSO - ASMP | ASMP |
| 106 | ටී.තේවකුරුල් | AO | BH Kalmunai |
| 102 | ඒ.පී.අයිරංගනී | DM | NHDA |
| 108 | වෛද්‍ය සී.පී.ඉරිදන් | RDHS Kalmunai | Health |
| 109 | ජේ.එම්.බී.එන්. ජයන්ත | MLAA | MLCO |
| 110 | බී.වී.ජේ.එන්. කුමාරසිංහ | OIC | VTA |
| 111 | එස්.යුගානන්දන් | Director | Hardy A.T.I. |
| 112 | එච්.බී.අනීස් | DDP | Planing Kachcheriya |
| 113 | හසිත අධිකාරී | DDP | Planing Kachcheriya |
| 114 | දිලුම් කුමාරගුරු | DDP | Planing Kachcheriya |
| 115 | ඒ.පිර්.වරුසවිතාන | DO | Planing Kachcheriya |
| 116 | අසංක සිරිකුමාර | DO | Planing Kachcheriya |
| 117 | වසන්තිකා නිරෝෂණී | DO | Planing Kachcheriya |
| 118 | එච්.සී.එම්.ඉනෝකා | DO | Planing Kachcheriya |
| 119 | අප්පුදන් | DO | Planing Kachcheriya |
| 120 | යසෝදරන් | DO | Planing Kachcheriya |
| 121 | ඩබ්.එස්.කේ.ටී.කුමාරතුංග | DO | Planing Kachcheriya |
| 122 | මලර් | MSO | Planing Kachcheriya |
| 123 | සේනක | CC | Planing Kachcheriya |
| 124 | එස්.ඒ.අයි.ඩී.ජයසේන | ලේකම් | අම්පාර නගර සභාව |
| 125 | ඩී.කේ.එම්.එම්.එම්.කුමාරිහාමි | ලේකම් | නාමල්ඔය ප්‍රාදේශීය සභාව |
| 126 | ආර්.එම්. සිරිවර්ධන | ලේකම් | ලාහුගල ප්‍රාදේශීය සභාව |
| 122 | පී.එච්.එම්.කේ. ප්‍රියදර්ශණී | ලේකම් | දමන ප්‍රාදේශීය සභාව |
| 128 | ම□දගොඩ | ලේකම් | උහන ප්‍රාදේශීය සභාව |
| 129 | පී.ඒ.අයි.අයි. ම□ණිකෙ | ලේකම් | මහඔය ප්‍රාදේශීය සභාව |
| 130 | අයි.කේ.සී.එල්. ඉහලවෙල | ලේකම් | පදියතලාව ප්‍රාදේශීය සභාව |
| 131 | අයි.එස්.ජී. කුමාරි | ලේකම් | දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව |
| 132 | මොහොමඩ් | ලේකම් | සම්මන්තුර ප්‍රාදේශීය සභාව |
| 133 | එල්.එම්.ඉරිෆාන් | නාගරික කොමසාරිස් | අක්කරපත්තු මහ නගර සභාව |
| 134 | ඒ.එම්.හබීබුරහමන් | ලේකම් | පොතුවිල් ප්‍රාදේශීය සභාව |
| 135 | ටී. පරමේෂ්වරන් | ලේකම් | නින්දවූර් ප්‍රාදේශීය සභාව |
| 136 | එස්.පතීරතන් | ලේකම් | නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාව |
| 137 | එස්.ශිහහුදීන් | ලේකම් | එරගම ප්‍රාදේශීය සභාව |
| 128 | එස්.එන්.එම්.අෂ්රෆ් | ලේකම් | අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය සභාව |
| 139 | අයි.සුරේස්වරම් | ලේකම් | අලියඩිවෙම්බු ප්‍රාදේශීය සභාව |
| 140 | ජේ.වීරපත්රන් | ලේකම් | තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව |
| 141 | ඒ.සුන්දරකුමාර | ලේකම් | කාරතිව් ප්‍රාදේශීය සභාව |
| 142 | ඒ.එල්.එම්.අස්මි | නාගරික කොමසාරිස් | කල්මුණ මහ නගර සභාව |